මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MF1/11/2/SDC/4
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.09. 03

තිරසර සංවර්ධන චක්‍රලේඛ අංක : **01/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**තිරසර සංවර්ධන අරමුණු මත පදනම් අයවැය සකස් කිරීම (SDG based Budget Formulation)**

1) එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාවද 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව කටයුතු කිරීමට අත්සන් තබා ඇත. ඒ අනුව 2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත මඟින් තිරසර සංවර්ධන සභාව පිහිටුවා එය නීතිගත කර ඇත.

2) තවද, 2030 වර්ෂයේ දී ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු ජාතික, ප්‍රාදේශීය හා ආයතනික සැලසුම් තුළට ප්‍රවාහගත කිරීම සඳහා පහත සඳහන් පරිදි මාර්ගෝපදේශ හා චක්‍රලේඛ උපදෙස් නිකුත්කර ඇත.

I. තිරසර සංවර්ධන අරමුණු වලට ගැළපෙන ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට උපදෙස් ලබා දෙමින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 2/2017 හා 2017.07.31 දිනැති අයවැය කැඳවීම - 2018 සඳහා අතිරේකය (II) 2018 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශය.

II. තිරසර සංවර්ධන අරමුණු වලට අනුගත සැලසුම් සකස් කිරීමේ කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා කේන්ද්‍රීය නිලධාරීන් පත්කිරීමට අදාළව තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක:MSDW/08/65 හා 2018.04.27 දිනැතිව නිකුත් කර ඇති ලිපිය.

III. අයවැය කැඳවීම - 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා මාර්ගෝපදේශය යන මැයෙන් නිකුත් කරන ලද 2018.07.17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 4/2018.

IV. ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය හා උපක්‍රමය සැකසීම මැයෙන් යුත් 2019.09.10 දිනැති අංක අ.ම.ප/19/2488/101/159 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය.

V. සියලුම රාජ්‍ය ආයතන තිරසර සංවර්ධන උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙමින් ඊට අදාළව ජනාධිපති ලේකම්ගේ අංක:PS/SP/SB/C/22/2019 හා 2019.10.03 දිනැති චක්‍රලේඛය.

VI. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අනු අංක 3 (1)(d), 5(2), 12(h), 17(b) සහ (d) යටතේ විගණකාධිපති වෙත පැවරී ඇති බලතල අනුව වාර්ෂිකව සිදු කරනු ලබන කාර්යසාධන විගණනයන්.

VII. වසර 2030 දී ළඟාකර ගැනීමට අපේක්ෂිත ජාතික ඉලක්ක අමාත්‍යාංශ මට්ටමින් හඳුනා ගැනීමට අදාළව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක:NP/HRD/SDG/Gen/22 හා 2023.01.02 දිනැතිව නිකුත් කර ඇති මාර්ගෝපදේශය.

VIII. තිරසර සංවර්ධන සභාව විසින් නිකුත් කර ඇති තිරසර සංවර්ධන අරමුණු 17 සහ ඉලක්ක 169 අනුව වියදම් ඇස්තමේන්තු ගැලපීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා උපදෙස් අඩංගු වර්ගීකරණ වගුව යොදා ගැනීමට අදාළ උපදෙස් ඇතුළත්ව නිකුත් කරන ලද අංක 04/2023 හා 2023.08.04 දිනැති අයවැය චක්‍රලේඛය.

3) එසේ වුවද, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය යම් පසුගාමී තත්ත්වයක පවතින බව ප්‍රගති පුවරුව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වේ. (ඇමුණුම් අංක 01) තවද, SDG Budget Coding and Tagging ක්‍රමවේදය මත පදනම්ව විශ්ලේෂණය කරන ලද තොරතුරු අනුව ද එක් එක් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක අතර ප්‍රතිපාදන බෙදී යාමේ විෂමතාවයන් පවතින බව අනාවරණය විය. ඒ අනුව ඉදිරි වර්ෂ සඳහා අයවැය සකස් කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

I. ආයතන මට්ටමින් ඉදිරි වර්ෂයට අදාළ වැය ඇස්තමේන්තු සකස් කිරීම හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අවස්ථා දෙකකදී සිදුවන බැවින් ඒ අතර ඒකාබද්ධතාව පවත්වා ගනිමින් තිරසර සංවර්ධන අරමුණු වලට අනුගත ලෙස සැලසුම් කිරීම අවශ්‍ය වේ. එහිදී, අමාත්‍යාංශය මට්ටමින් මේ වනවිට හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ අවධානය යොමු කර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම.

II. 2024 වර්ෂයට අදාළව සිදු කරන ලද SDG Budget Coding and Tagging ක්‍රමවේදය හරහා මේ වන විටත් හඳුනාගෙන ඇති පරිදි ප්‍රතිපාදන වෙන් කර ගැනීමේ පරතරයන් පවතින (Gap Areas) තිරසර සංවර්ධන ඉලක්ක වලට වැඩි අවධානය යොමු කිරීම සිදු කිරීම යෝග්‍ය වේ. ඒ සඳහා සකස් කළ තොරතුරු ඇතුළත් වගුව (ඇමුණුම් අංක 02 ) සහ තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය දැක්වෙන ප්‍රගති පුවරුවෙහි තොරතුරු කෙරෙහිද අවධානය යොමු කිරීම.

III. සෑම අමාත්‍යාංශයක්ම සහ ඒ යටතේ පවතින ආයතනයක්ම ඉදිරි අයවැය සකස් කිරීමේදී වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිශ්චිතවම කුමන තිරසර සංවර්ධන අරමුණ හා ඉලක්ක සඳහා දායක වන්නේ ද යන්න හඳුනා ගැනීම පහසු කිරීමට පුනරාවර්තන වියදම් (Recurrent Expenditure) මෙන්ම මූලධන වියදම් (Capital Expenditure) පහත දක්වා ඇති උදාහරණ පරිදි වර්ගීකරණ වගුව අනුව SDG Budget Coding and Tagging සිදු කිරීම.

උදා: නිශ්චිත ව්‍යාපෘති වියදම්

| ව්‍යාපෘතිය /ප්‍රධාන ක්‍රියාකාරකම (Main Project/Main Activity) | අනු ක්‍රියාකාරකම් (Sub Components/Sub Activities) | ඇස්තමේන්තුගත වියදම (රු.මි.) | තිරසර සංවර්ධන ඉලක්ක (SDG Targets) |
|---|---|---|---|
| දේශගුණික සුහුරු ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Integrated Agriculture Project) | දේශගුණික අනුවර්තනයන්ට සුදුසු භෝග හඳුන්වාදීම | 50 | 2.4 |
| | ගොඩවීමට ලක් වී ඇති කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම | 100 | 6.4 |

උදා: සාමාන්‍ය පොදු වියදම්


| අයවැය ව්‍යාපෘතිය (Budget Project) | වියදම් විෂයයන්හි ආර්ථික වර්ගීකරණය (Economic Categories of Objects) | ඇස්තමේන්තුගත වියදම (රු.මි.) | තිරසර සංවර්ධන ඉලක්ක (SDG Targets) |
|---|---|---|---|
| පරිසර අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා (General Administration and Establishment Services ) | පුද්ගල පඩිනඩි | 15 | 6.4 |
| | ප්‍රවාහන වියදම් | 10 | 6.4 |

4. මේ පිළිබඳ යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් දු.අංක 0112885241 හෝ dg@sdc.gov.lk මඟින් තිරසර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සම්බන්ධ කර ගැනීම සුදුසු වේ.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

# තිරසර සංවර්ධන ප්‍රගති පුවරුව - 2024

| Goal | Target | Description | Status |
|---|---|---|---|
| Goal 1 | 1.2 | National poverty | Yellow |
| | 1.3 | Social protection | Yellow |
| | 1.4 | Access to basic services | Yellow |
| | 1.5 | Resilience to disasters | Yellow |
| | 1.a | Resources for poverty programs | Yellow |
| Goal 2 | 2.1 | Undernourishment and food security | Yellow |
| | 2.2 | Malnutrition | Yellow |
| | 2.3 | Small-scale food producers | Yellow |
| | 2.4 | Sustainable agriculture | Green |
| | 2.5 | Genetic resources for agriculture | Yellow |
| | 2.a | Investment in agriculture | Yellow |
| | 2.c | Food price anomalies | Red |
| Goal 3 | 3.1 | Maternal mortality | Yellow |
| | 3.2 | Child mortality | Green |
| | 3.3 | Communicable diseases | Yellow |
| | 3.4 | NCD & mental health | Yellow |
| | 3.5 | Substance abuse | Yellow |
| | 3.6 | Road traffic accidents | Green |
| | 3.7 | Sexual & reproductive health | Green |
| | 3.8 | Universal health coverage | Yellow |
| | 3.9 | Health impact of pollution | Yellow |
| | 3.a | Tobacco control | Yellow |
| | 3.b | R&D for health | Red |
| | 3.c | Health financing & workforce | Yellow |
| | 3.d | Management of health risks | Green |
| Goal 4 | 4.1 | Effective learning outcomes | Yellow |
| | 4.2 | Early childhood development | Red |
| | 4.3 | TVET & tertiary education | Green |
| | 4.4 | Skills for employment | Yellow |
| | 4.5 | Equal access to education | Yellow |
| | 4.a | Education facilities | Yellow |
| | 4.b | Scholarships | Red |
| | 4.c | Qualified teachers | Red |
| Goal 5 | 5.2 | Violence against women & girls | Yellow |
| | 5.5 | Women in leadership | Yellow |
| Goal 6 | 6.1 | Safe drinking water | Yellow |
| | 6.2 | Access to sanitation & hygiene | Yellow |
| | 6.4 | Water-use efficiency | Yellow |
| | 6.5 | Transboundary water cooperation | Yellow |
| | 6.6 | Water-related ecosystems | Yellow |
| | 6.a | Int. cooperation on water & sanitati.. | Red |
| | 6.b | Participatory water & sanitation mg.. | Green |
| Goal 7 | 7.1 | Access to energy services | Yellow |
| | 7.2 | Share of renewable energy | Yellow |
| | 7.3 | Energy efficiency | Green |
| | 7.a | Int. cooperation on energy | Green |
| | 7.b | Investing in energy infrastructure | Yellow |
| Goal 8 | 8.1 | Per capita economic growth | Red |
| | 8.2 | Economic productivity & innovation | Red |
| | 8.3 | Formalization of SMEs | Red |
| | 8.4 | Material resource efficiency | Yellow |
| | 8.5 | Full employment & decent work | Yellow |
| | 8.6 | Youth NEET | Green |
| | 8.7 | Child & forced labour | Green |
| | 8.8 | Labour rights & safe working env. | Red |
| | 8.9 | Sustainable tourism | Red |
| | 8.10 | Access to financial services | Yellow |
| | 8.a | Aid for Trade | Red |
| | 8.b | Strategy for youth employment | Yellow |
| Goal 9 | 9.1 | Infrastructure development | Yellow |
| | 9.2 | Sustainable/inclusive industrialization | Red |
| | 9.4 | Sustainable & clean industries | Green |
| | 9.5 | Research and development | Yellow |
| | 9.a | Resilient infrastructure | Yellow |
| | 9.b | Domestic technology development | Red |
| | 9.c | Access to ICT & the Internet | Green |
| Goal 10 | 10.1 | Income growth (bottom 40%) | Green |
| | 10.2 | Inclusion (social, economic & political) | Red |
| | 10.4 | Fiscal & social protection policies | Yellow |
| | 10.7 | Safe migration & mobility | Yellow |
| | 10.a | Special & differential treatment (WTO) | Green |
| | 10.b | Resource flows for development | Red |
| | 10.c | Remittance costs | Yellow |
| Goal 11 | 11.1 | Housing & basic services | Yellow |
| | 11.2 | Public transport systems | Yellow |
| | 11.3 | Sustainable urbanization | Yellow |
| | 11.4 | Cultural & natural heritage | Red |
| | 11.5 | Resilience to disasters | Yellow |
| | 11.6 | Urban air quality & waste mgmt. | Yellow |
| | 11.b | Disaster risk management policies | Yellow |
| Goal 12 | 12.2 | Sustainable use of natural resources | Green |
| | 12.3 | Food waste & losses | Green |
| | 12.5 | Reduction in waste generation | Green |
| | 12.6 | Corporate sustainable practices | Red |
| | 12.a | Support for R&D capacity for SD | Yellow |
| | 12.b | Sustainable tourism monitoring | Yellow |
| | 12.c | Fossil-fuel subsidies | Red |
| Goal 13 | 13.1 | Resilience & adaptive capacity | Yellow |
| | 13.2 | Climate change policies | Green |
| Goal 14 | 14.1 | Marine pollution | Red |
| | 14.2 | Marine & coastal ecosystems | Yellow |
| | 14.3 | Ocean acidification | Red |
| | 14.4 | Sustainable fishing | Yellow |
| | 14.5 | Conservation of coastal areas | Yellow |
| | 14.6 | Fisheries subsidies | Yellow |
| | 14.7 | Marine resources for SIDS & LDCs | Red |
| | 14.b | Small-scale artisanal fishing | Yellow |
| | 14.c | Implementing UNCLOS | Yellow |
| Goal 15 | 15.1 | Terrestrial & freshwater ecosystems | Yellow |
| | 15.2 | Sustainable forests management | Yellow |
| | 15.4 | Conservation of mountain ecosystems | Yellow |
| | 15.5 | Loss of biodiversity | Red |
| | 15.6 | Utilization of genetic resource | Yellow |
| | 15.8 | Invasive alien species | Green |
| | 15.a | Resources for biodiversity & ecosyste.. | Red |
| | 15.b | Resources for forest management | Red |
| Goal 16 | 16.1 | Reduction of violence & related deaths | Green |
| | 16.2 | Human trafficking | Yellow |
| | 16.3 | Justice for all | Yellow |
| | 16.6 | Effective institutions | Green |
| | 16.7 | Inclusive decision-making | Red |
| | 16.10 | Public access to information | Yellow |
| | 16.a | Capacity to prevent violence | Green |
| Goal 17 | 17.1 | Tax & other revenue collection | Red |
| | 17.3 | Additional financial resources | Red |
| | 17.4 | Debt sustainability | Red |
| | 17.6 | Science and tech int. cooperation | Yellow |
| | 17.7 | Transfer of technologies | Yellow |
| | 17.8 | Capacity building for ICT | Yellow |
| | 17.9 | Capacity building for SDGs | Green |
| | 17.10 | Multilateral trading system (WTO) | Red |
| | 17.11 | Exports of developing countries | Red |
| | 17.12 | Duty-free market access for LDCs | Yellow |
| | 17.17 | Partnerships (public, private, CSO) | Yellow |
| | 17.18 | National statistics availability | Yellow |
| | 17.19 | Statistical capacity | Yellow |



| ප්‍රතිපාදන වෙන් කර ගැනීමේදී පවතින පරතරයන් (Gap Areas) | | |
|---|---|---|
| ති.සං.ඉලක්ක (SDG Target) | විෂය ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු ආයතන |
| 2.2 | • මන්දපෝෂණය | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 3.1 සහ 3.2 | • ළමා හා මාතෘ මරණ අනුපාතය | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 3.d | • සෞඛ්‍ය පර්යේෂණ | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 4.1 | • කාර්යක්ෂම ඉගෙනුම් ප්‍රතිඵල | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4.2 | • මුල් ළමාවිය සංවර්ධනය | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4.5 | • අධ්‍යාපනය සඳහා සමානාත්මතා ප්‍රවේශය | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4.c | • සුදුසුකම්ලත් ගුරුවරු | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 5.2 | • කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |
| 6.3 | • ජලයේ ගුණාත්මකභාවය | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය |
| 6.6 | • ජලය ආශ්‍රිත පරිසර පද්ධති | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය |
| 7.2 | • පුනර්ජනනීය බලශක්ති භාවිතය | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 7.3 | • බලශක්ති කාර්යක්ෂමතාව | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය<br>කර්මාන්ත අමාත්‍යාංශය |
| 8.2 | • ආර්ථික ඵලදායිතාව හා නවෝත්පාදන | කර්මාන්ත අමාත්‍යාංශය |
| 8.5 | • රැකියාගත වීම හා සුනිසි රැකියා | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය |
| 8.9 | • තිරසර සංචාරක කර්මාන්තය | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය |
| 9.2 | • තිරසර සංයුක්ත කර්මාන්තකරණය | කර්මාන්ත අමාත්‍යාංශය |
| 9.5 | • නවෝත්පාදන දිරිගැන්වීම සඳහා පර්යේෂණ හා සංවර්ධන | කර්මාන්ත අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 9.b | • කර්මාන්ත සඳහා දේශීය තාක්ෂණ සංවර්ධනය | කර්මාන්ත අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 11.6 | • නාගරික වායුගෝලීය ගුණාත්මකභාවය හා කසළ කළමනාකරණය | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 12.3 | • ආහාර අපතේ යාම හා පසු අස්වනු හානිය වලක්වාලීම | කෘෂිකර්ම අමාත්‍යාංශය<br>වෙළඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| 14.2 | • සාගර සහ වෙරළ ජෛව පරිසර පද්ධති | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| 14.5 | • වෙරළ ප්‍රදේශ සංරක්ෂණය | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය |
| 15.5 | • ජෛව විවිධත්ව හායනය | පරිසර අමාත්‍යාංශය |
| 15.8 | • ආක්‍රමණික ජීව විශේෂ තුරන් කිරීම | පරිසර අමාත්‍යාංශය |
| 16.6 | • කාර්යක්ෂම ආයතන ( පරිපාලන කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා වන ක්‍රමවේද/ මූල්‍ය විනිවිදභාවය තහවුරු කරන ක්‍රමවේද/දත්ත ගොනු කිරීම හා භාවිත කාර්යක්ෂම කරන ක්‍රමවේද ඇති කිරීම) | සියලුම අමාත්‍යාංශ |
| 16.7 | • අන්තර්කරණ වූ තීරණ ගැනීම | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 16.10 | • තොරතුරු සඳහා මහජන ප්‍රවේශය | ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 17.1 | • බදු හා සෙසු ආදායම් එකතු කිරීම් | මුදල් අමාත්‍යාංශය |
| 17.4 | • ණය තිරසරකරණය | මුදල් අමාත්‍යාංශය |
| 17.18 | • දත්ත ධාරිතා වර්ධනය | මුදල් අමාත්‍යාංශය (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |